**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 27 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ඌන බිල්කිරීම් රු. 125,583 ක් සඳහා ගැලපීම් කර නොතිබුණි. | ගිණුම්වල නිවැරදිව ගැලපීම් කළ යුතුවේ. | වැඩිපුර ලැබී ඇති මුදල ගිණුම්ගතකිරීමේ ද්විත්ව සටහන හඳුනාගත නොහැකි වීම නිසා වැඩිපුර ලැබීමක් සේ ගිණුම්ගත කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 317,410 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කරගත යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයට අදාල පොළිය පමණක් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 112,380 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගී ලේඛනවල ගිණුම් ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන ඇත. ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම
-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 12 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මැයි මස 15 දිනට පෙර සියළු වාහන වල ඉන්ධන පරීක්ෂාවන් සිදුකිරීමට සැලසුම් කර ඇත. |
| (ආ) | 2005 ජූනි 01 දිනැති අංක 2005/04 දරන "ඇතැම් ඉඩම් විකිණීම මත බදු අයකිරීම" සම්බන්ධයෙන් වූ සබරගමුව පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 02 (iv) ඡේදය | තැන්පතු මුදල් ගෙවීමෙන් පසුව විකුණනු ලබන ඉඩම් කොටස්වල විකුණුම් මිල, ඔප්පු අංකය යනාදී විස්තර ඇතුලත් වූ වාර්තාවක් සමඟ විකුණනු ලබන ඉඩම්වල වටිනාකමට අදාල සියයට 01 බදු මුදල ඉඩම් කොටස් විකුණනවාත් සමඟම විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට වූ කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමකින් තොරව බල ප්‍රදේශය තුල ඉඩම් වෙන්දේසි 02 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | ඉඩම් කට්ටි සැලසුම් සඳහා ගිවිසුම් ගතවීම අතපසුවී ඇති අතර, මේ වනවිට එම ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,751,407 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,475,978 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,853,464 | 6,474,707 | 6,000,039 | 3,821,378 | 6,223,607 | 6,419,784 | 6,093,202 | 3,101,940 |
| (ii) | කුලී | 7,682,640 | 8,293,506 | 8,175,115 | 269,543 | 7,850,458 | 7,163,848 | 7,106,582 | 405,952 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,611,200 | 1,821,562 | 1,819,199 | - | 1,153,200 | 1,410,043 | 1,459,693 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,948,536 | 13,881,927 | 29,884,906 | 14,761,666 | 14,335,487 | 14,919,263 | 10,651,425 | 18,101,766 |

**2.2.2 වරිපනම් හා බදු**

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට රු. 1,571,747 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂ 03 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 48 කට අදාල ශේෂය රු. 279,569 ක් විය. එම හිඟ ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක විය. | හිඟ ආදායම් රැස්කිරීමට විධිමත් හා කඩිනම් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ආදායම් පරිපාලක පුරප්පාඩුව මේ වනවිට සම්පූර්ණ වී ඇති අතර, ඊට අමතරව ආදායම් රැස්කිරීමේ සැලැස්මක් සකස් කර ඇත. ඒ අනුව ආදායම් රැස්කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රු. 82,945 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වර්ෂ 05 ට වඩා පැරණි ඒකක 60 කට අදාල ශේෂය රු. 60,712 ක් විය. | හිඟ ආදායම් රැස් කිරීම සඳහා විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අක්කර බදු සනොක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතින අතර, හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 කුලී**

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ කඩ කුලී හේතුවෙන් රක්වාන වෙළඳ සංකීර්ණයේ කඩකාමර 02 ක් 2007 හා 2015 වර්ෂ වල සභාව වෙත ආපසු පවරාගෙන තිබුණ ද එදිනට පැවති හිඟ කඩ කුලිය රු. 78,285 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයකර ගැනීමට හෝ බදුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හෝ කර නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීම සඳහා විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | කඩකාමර දෙකෙහි හිඟ කඩකුලී ඉදිරියේ දී අයකර ගැනීමටත් ගෙවීම පැහැරහරින්නේ නම් අදාළ නීතිමය කටයුතු වලට යොමුවන බවත් දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබා ගතයුතු නමුත් බලපත්‍ර ලබා නොගත් ආයතන 20 ක් හා බලපත්‍ර අළුත් නොකරන ලද ආයතන 04 ක් පැවතුණි. මෙම හේතුවෙන් සභාවට රු. 96,800 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍ර නොගත් කර්මාන්ත සම්බන්ධයෙන් මේ වනවිට ස්ථානීය පරීක්ෂණයක් සිදු කරමින් පවතී. |

වගකීමද ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 62,481 ක් 2019 අප්‍රේල් වනවිටත් ලැබී නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීම සඳහා විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මුද්දර ගාස්තු රු. 62,481 ක් ලැබෙන්නට සලස්වන ලෙස ඉල්ලා සබරගමුව පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යවා ඇත. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු. 1,650,000 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 03 ක් ප්‍රමාණවත් මුදල් නොමැතිවීමෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අයවැයගත ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට සභාව කටයුතු කළ යුතුවේ. | මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකල බව දන්වමි. |
| (ii) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සකස් කර තිබුණු සංවර්ධන සැලැස්මෙහි සභාව විසින් එක් එක් වර්ෂයන්හීදී ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි. | සංවර්ධන සැලැස්ම තුල එක් එක් වර්ෂයන්ට අදාල සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව හඳුනාගෙන තිබිය යුතුවේ. | 2019 – 2022 සංවර්ධන සැලැස්ම තුල එක් එක් වර්ෂයන් හීදී ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් වෙන් වෙන්ව හඳුනාගෙන ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා මේ වනවිට ක්‍රමවත් වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. ඒ යටතේ කසළ එකතු කිරීමේදී වෙන් කර ලබාගන්නා අතර වෙන්කරන ලද කසළ වෙන් වෙන්ව බැහැර කරනු ලබයි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු නිවැරදිව හඳුනාගෙන ඊට අදාල දිගුකාලීන සැලසුම් සකස් කළ යුතුවේ. | මේ යටතේ ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට අයත් බලවින්න ගොවිපලෙහි කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට නොපියවූ අත්තිකාරම් වල ඇතුලත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවූ රු. 37,866 ක අධිභාර මුදලට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව කටයුතු කර නොතිබුණි. | අදාල අධිභාරය ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුවේ. | අධිභාර මුදල අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 සිට 2018 දක්වා කාලපරිච්ඡේදය තුල සේවා ගිවිසුම් මත බඳවාගෙන තිබූ සේවකයින් 12 දෙනෙකු සමාලෝචිත වර්ෂය වනවිටත් සේවයේ යොදවා තිබූ අතර, ඔවුන් වෙනුවෙන් 2018 වර්ෂය තුල සහා අරමුදලින් රු. 3,183,782 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අනුමත තනතුරු සඳහා විධිමත් පරිදි සේවකයින් බඳවාගත යුතුවේ | සේවා ගිවිසුම් මත බඳවාගෙන තිබෙන සේවකයින් 12 දෙනාම අත්‍යවශ්‍ය කටයුතු වල සේවයේ යොදවා ඇති අතර, අනුමත තනතුරු වල මොවුන් සේවය කරන බැවින් ඔවුන් ස්ථිර තත්ත්වයට පත් කරන ලෙස රත්නපුර පළාත් පාලන සහකාර කොමසාරිස් මහින් ඉල්ලීම් කර ඇති බව දන්වමි. |
| (ආ) | දීර්ඝ කාලයක සිට පැවත එන නිලධාරීන් 06 දෙනෙකුගේ රු. 90,447 ක් වූ සේවක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අයකරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය සියළු කටයුතු නොපමාව සිදු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි පරිදි නඩත්තු හා අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් අබලන් තත්ත්වයට පත්ව තිබෙන සහා සේවකයින් පදිංචිව සිටින නිවාස 04 ක කුලිය අඩුකර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීමක් කර තිබුණද, අදාල නිවාස අළුත්වැඩියා කිරීම කෙරෙහි සහාව අවධානය යොමුකර නොතිබුණි. | සභාව සතු නිල නිවාස විධිමත්ව නඩත්තු කළ යුතුවේ. | එම නිවාස නඩත්තු කටයුතු කිරීම සඳහා ඉල්ලීම් ලැබෙන පරිදි තාවකාලික පිළියම් කිරීමට සභාව කටයුතු කර ඇති අතර විධිමත්ව එම නිවාස නඩත්තු කිරීම සඳහා මෙන්ම නිවාස කුලිය අඩු කිරීම සඳහා ද මහා සභාවට මෙන්ම පළාත් පාලන කොමසාරිස් වෙත ද ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |

**3.4.2 පවරානොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ගොඩනැගිලි හා සුසාන භූමි සඳහා වෙන්කර ඇති ඉඩම් 37 ක අයිතිය විධිමත්ව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි. | ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු සුසාන භූමි 37 ක අයිතිය නාමිකව ප්‍රාදේශීය සභාව සතු වුවද, වර්තමානයේදී එම ඉඩම් වල අයිතිය ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරයා සතුවය. පවරා දීම සඳහා ඉල්ලීම් කලද කිසිඳු වගවීමක් ඔවුන් මේ සඳහා ගෙන නොමැති බව දන්වමි. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෞඛ්‍ය සේවකයින් සඳහා ටී ෂර්ට් මිලදී ගැනීමට 2018 මැයි 08 දින පෞද්ගලික ආයතනයක් වෙත රු. 15,500 ක අත්තිකාරමක් ලබාදී තිබුණද 2019 මැයි 10 දින වනවිටත් ඇණවුම් කල ටී ෂර්ට් සභාව වෙත ලැබී නොතිබුණු බැවින් අත්තිකාරම ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | එකී මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 4,496,835 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට නියමිත පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකරගෙන යාමට කටයුතු කරමි. |

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රක්වාන හොරමුල්ල ඕබඩකන්ද මාර්ගයේ පොලොන්ඇල්ල අසල මාර්ගය පහල කොටස් නායගිය ස්ථානයේ පැති බැම්ම හා බෝක්කුව සෑදීම රු. 1,075,902 ක් වැයකර 2017 දෙසැම්බර් 31 වැඩ අවසන් කර තිබුණි. පැති බැම්ම හා මාර්ගය අතර පස් පුරවා තැලීම නිසි ප්‍රමිතියට සිදුකර නොතිබීම හේතුවෙන් 2018 මාර්තු වනවිට පැති බැම්මෙහි පස් පිරවුම මතවූ කොන්ක්‍රීට් තට්ටුව හා කොන්ක්‍රීට් මාර්ගය කැඩී තිබුණු අතර, 2019 පෙබරවාරි වනවිටත් එම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. එම හේතුවෙන් අදාල වැඩ විෂයය සඳහා | නිසි අධීක්ෂණයක් යටතේ කර්මාන්තයේ අඩුපාඩු නිසි ප්‍රමිතියෙන් යුක්තව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | පතල් කැණීමේ දෝනාවක් නිසා සිදුව ඇති බලපෑම් ස්ථාවර වන තෙක් අදාළ සමිතිය කල් ඉල්ලා සිටින අතර, ඉන් පසු එම කොටස පිළිසකර කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | වැයකර තිබූ රු. 96,497 ක් නිෂ්ඵල වී තිබුණි. | | |
| (ආ) | නියැදි පරීක්ෂාවට අනුව කර්මාන්ත 05 ක මාර්ග උරහිස් පිරවීම, රෝල ප්‍රවාහනය හා පැති ලැලි වෙනුවෙන් එකතුව රු. 27,931 ක් ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි. | කර්මාන්ත නිසි අධීක්ෂණයකින් යුක්තව ක්‍රියාත්මක කළ යුතු අතර, වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 2,984,400 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 42 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | වාර්ෂික ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | පෙර වර්ෂ වල වියදම් සලකා ප්‍රතිපාදන වෙන් කලද, එම වැය විෂයන් සඳහා වවුචර්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත. |